www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# චීනයෙහි "රතු ධනවාදියාගේ" අභාවය හා 1949 වසරේ විප්ලවය

## The death of China's "red capitalist" and the 1949 revolution

**ජෝන් චැන් විසිනි**
**2005 නොවැම්බර් 29**

මාඕ සේතුං විසින් ස්ථාපිත කරන ලද කොමියුනිස්ට් පක්ෂ ආන්ඩුවට සහයෝගය දුන් 1949 වසරට පෙර චීන ධනවාදි ප්‍රභූවෙහි කැපීපෙනෙන සාමාජිකයකු වූ රොං යිරෙන් පසු ගිය ඔක්තෝබර් 26 දා බීජිංහි දී මිය ගියේ ය. මිය යන විට ඔහුගේ වයස අවුරුදු 89ක් විය. "රතු ධනවාදියා" ලෙස වඩාත් හොඳින් හැඳින්වුනු රොංගේ ජීවිතය ආරම්භයේ සිටම ස්ටැලින්වාදී තන්ත්‍රය හා චීන ධනපති පන්තියේ කොටස් අතර පැවති සමීප සබඳතාවන් හි ප්‍රතිමූර්තියක් විය.

"නූතන චීන ජාතික කර්මාන්තකරුවන්ගේ ප්‍රධාන පෙලේ නියෝජිතයකු, කැපී පෙනෙන ජාතික නායකයකු, ප්‍රබල දේශප්‍රේමියකු හා කොමියුනිස්ට් වීරයකු වසයෙන්" සින්හුවා ප්‍රවෘත්ති ඒජන්සිය විසින් ඉදිරිපත් කරන ලද නිල මරන නිවේදනයෙහි රොං හඳුන්වා දෙන ලදි. ඔහුගේ සමුගැනීමේ උත්සවය පවත්වන ලද්දේ ජ්‍යෙෂ්ඨ නායකයින් භූමදානය කරන ලද බීජිංහි බබාඕ හිල්හි දී ය. අගමැති වෙන් ජියාඕබාඕ ප්‍රධාන කොට ගෙන කැපීපෙනෙන චීන නායකයින් දුසිම් ගනනින් එම උත්සවයට සහභාගිවිය.

මිය යන අවස්ථාව වන විට, ඊනියා "කොමියුනිස්ට් වීරයා" චීනයෙහි සිටි ධනවත්ම පුද්ගලයකු විය. 1979 වසරේ වෙලඳපොල ප්‍රතිසංස්කරන හඳුන්වාදීමෙන් පසු වසර කිහිපය තුල දී විශාල ධනස්කන්ධයක් රැස්කිරීමට රොං සිය සබඳතා උපයෝගී කොට ගත්තේ ය. එය චීන විප්ලවයට ප්‍රථමයෙන් සිය පවුල සතු ධනයට වඩා විශාල ලෙස වැඩි වූවකි.

චීන ජාත්‍යන්තර භාර හා ආයෝජන සංස්ථාවෙහි මූලිකත්වය දැරීමට 1979 වසරේ දී රොං තෝරා පත් කරගන්නා ලදී. 1993 වසර සිට 1998 වසර දක්වා චීනයෙහි උප ජනාධිපතිවරයෙකුවූ ඔහු ජාතික ජනතා කොංග්‍රසයෙහි විධායක තත්වයක් ඉසිලීය. ඔහුගේ පුද්ගලික ධනය එක්සත් ජනපද ඩොලර් බිලියන 1.9ක් ලෙස 2000 වසරේ දී එක්සත් ජනපදයෙහි පදනම් වූ ෆෝබ්ස් සඟරාව ගනන් බැලීය.

නැගෙනහිර ජියැංසු පලාතෙහි 1916 වසරේ උපත ලත් රොං ෂැංහයි නගරයේ පිහිටි ශාන්ත ජෝන් විශ්වවිද්‍යාලයෙන් සිය උපාධිය ලැබීය. ඉසුරුමත් ධනේශ්වර පවුලක පුතෙකු වූ ඔහු වරප්‍රසාද ලත් ශික්ෂනයකට හිමිකම් කීය. සුඛෝපභෝගී මන්දිරයක විසූ ඔහු බ්‍රිතාන්‍යයෙහි නිපදවන ලද (විනෝදය සඳහා පදවන) ස්පෝර්ට්ස් වර්ගයේ මොටර් රථයක් පැදවී ය.

1949 වසරේ විප්ලවයට කෙටි කලකට පෙරාතුව, පවුලේ ව්‍යාපාර රොං සිය පාලනය යටතට ගත්තේ ය. ඒ වන විට එම ව්‍යාපාරවලට රෙදි කම්හල් හා පිටි කම්හල් 20 කට අධික ප්‍රමානයක් ඇතුලු විය. ඒවායෙහි සේවක සංඛ්‍යාව 80,000ක් පමන විය. තවද, ඔහු ෂැංහයි නගරයේ බැංකුවක සභාපති විය. ධනවත් රොං මාඕවාදී තන්ත්‍රයට සහාය වූයේ කෙසේ ද යන්න එම තන්ත්‍රය පදනම් වූ ස්ටැලින්වාදී ඉදිරිදර්ශනය හා එකට බැඳී ඇති කරුනයි.

අන් සියලු යටත් විජිත රටවල් මුහුන දෙන්නට සිදුවූ පරස්පරයන්ට චීනයේ ධනවාදී වර්ධනයට ද මුහුන දෙන්නට සිදු විය. ඓතිහාසික වසයෙන් ප්‍රගතිශීලී භූමිකාවක් රඟපෑමට චීන ධනේශ්වරය අපොහොසත් විය. චීන ධනේශ්වරය ආර්ථික වසයෙන් අධිරාජ්‍යවාදී බලවතුන්ගෙන් යැපුනි. එය ගම්බද පෙදෙස්වල අර්ධ-වැඩවසම් ඉඩම්හිමි කොටස් සමග එකට වෙලී තිබුනි. තවද එයට වේගයෙන් ව්‍යාප්ත වන කම්කරු පන්තියෙහි අරගල තුලින් පහල මට්ටමින් දිගින් දිගට ම තර්ජන එල්ලවුනි.

අධිරාජ්‍යවාදී පද්ධතියට එරෙහිව ඇතිවුනු 1911 වසරේ විප්ලවයෙහි ප්‍රතිඵලය වූයේ වසර ගනනාවක් තිස්සේ හමුදා නායකයින් ගනනාවකගේ පාලනය තහවුරු වීමත් 1925 සිට 1927 වසර අතර දෙවැනි චීන විප්ලව කාල පරිච්ඡේදය තුල පුපුරාගිය දැවැන්ත පන්ති ආතතීන් නිර්මානය වීමත් ය. කම්කරු පන්තිය පොඩිපට්ටම් කිරීමෙන් අනතුරුව සිදු වූයේ චියැං කායිෂෙක්ගේ කෝමින්ටැනය (කේඑම්ටී) යටතේ දූෂිත ආඥාදායකත්වයක් ස්ථාපිත වීමයි. 1931 වසරේ දී ජපාන අධිරාජ්‍යවාදය මුලු චීනය ම ආක්‍රමනය කලේ ය. ඉන් ඇතිවූයේ මහත් ව්‍යසනයකි.

දෙවැනි ලෝක සංග්‍රාමයෙන් පසුව ඇතිවූ තත්වය තුල ආර්ථික ප්‍රතිපත්තියක් උදෙසා දේශපාලන

කොන්දේසි නිර්මානය කිරීම කෙසේ වුවද, කේඑම්ටී ආඥාදායකත්වය චීනය එක් රටක් සේ පවත්වාගෙන යාමට යම්තමින් සමත් වූවා පමනි. 1940 ගනන්වල අගභාගයේ දී අතිප්‍රද්ධමනය, නිල දූෂනය හා නය පද්ධතියේ බංකොලොත්බව හේතු කොට ගෙන චීන කර්මාන්තවලට මරු පහරක් වැදුනි. ආර්ථික අර්බුදය විසඳීමට කේඑම්ටී ආන්ඩුව අපොහොසත්වීමේ හේතුවෙන් රොං වැනි චීන ධනේශ්වරයේ කොටස් මාඕසේතුං යටතේ චීන කොමියුනිස්ට් (සීසීපී වෙත හැරුනි.

ගම්බද ගොවි ජනතාව මත පදනම්වූ සීසීපීය සමාජවාදී ජාත්‍යන්තරවාදය අත්හැරියේ මීට බොහොම කලකට පෙරාතුවයි. ඒ වෙනුවට, සෝවියට් සංගමයෙහි ස්ටැලින්වාදී නිලධාරි තන්ත්‍රය විසින් ඉදිරිපත් කරන ලද, 1927 වසරේ චීන කම්කරු පන්තිය ලත් බේදජනක පරාජයන්ට වගකිවයුතු "අවධිදෙකෙහි න්‍යාය" මාඕ අනුමත කලේ ය. 1917 වසරේ රුසියානු විප්ලවයෙන් ලත් පාඩම් ප්‍රතික්ෂේප කරමින් ස්ටැලින්වාදීන් දිගටම පවසා සිටියේ කම්කරු පන්තිය බලය අත්පත් කර ගැනීමේ යම් හෝ හැකියාවක් එලඹීමට පෙරාතුව චීනය ධනවාදය යටතේ දිගු කාල පරිච්ඡේදයක් ගෙවිය යුතුය යන්න ය.

1945 වසරේ ජපානය යටත් වීමෙන් අනතුරුව, මාඕ ධනවාදයට පක්ෂපාතී එම ඉදිරි දර්ශනය ම ඉදිරිපත් කලේ ය. ඔහු කේඑම්ටීය සමග ධනේශ්වර සන්ධාන ආන්ඩුවක් වෙනුවෙන් පෙනී සිටියේ ය. පන්ති හතරක ඒකාබද්ධතාවය - කම්කරු පන්තිය, ගොවි ජනතාව, සුලුධනේශ්වරය හා ජාතික ධනපතියන්ගේ ඊනියා " ප්‍රගතිශීලී" ස්තරය අතර සහයෝගිතාව - යන මන්ත්‍රය යටතේ මෙය ප්‍රවර්ධනය කෙරුනි.

## විප්ලවීය පෙරලාදැමීම

සන්ධාන ගතවීමේ මේ යෝජනාව කේඑම්ටීය ප්‍රතික්ෂේප කලේ ය. මැන්චූරියාවේ කාර්මික වසයෙන් වර්ධනය වූ පලාත් අල්ලා ගැනීම තුලින් හා අත්පත් කරගත් ජපන් ආයුධ විශාල ප්‍රමානයක් සීසීපීයට ලබාදීම තුලින් සෝවියට් සංගමය එක්සත් ජනපද සහාය ලත් කේඑම්ටීය දුර්වල කිරීමේ තත්වයන් තුල සිවිල් යුද්ධය ඇතිවුනි. මාඕගේ ගරිල්ලා බලකායන් නගර අල්ලාගැනීමට සමත් හමුදා බවට පරිවර්තනය වුනි. 1949 වසර වන විට සීසීපීය තීරනාත්මක යුද හමුදාමය ජයග්‍රහනයක් අත් පත් කර ගත් අතර කේඑම්ටීය බිඳ වැටුනි. චියෑං කායිෂෙක් හා ඔහුගේ තන්ත්‍රයට සම්බන්ධවූ ධනවාදී ප්‍රභූව තායිවාන දූපත වෙත පලාගියහ.

එසේ වුවද, රොං යිරෙන් වැනි ඇතැම් ධනවාදී කේඑම්ටී පාලනයෙහි ව්‍යාකුලත්වයෙන් පසු සීසීපීය බලයට පැමිනීම උනුසුම් ලෙස පිලිගත්හ. මාඕගේ ගැමි "රතු" හමුදා ප්‍රධාන නගරවලට ඇතුලු වූවිට ඔවුහු කම්කරු පන්තිය තුල ස්වාධීන සංවිධානයේ සියලු ලක්ෂන යටපත් කර පුද්ගලික දේපල ආරක්ෂා කලහ. ෂැංහයිහි දී නව තාක්ෂනය රොංගේ ව්‍යාපාරයට අරමුදල් අමුද්‍රව්‍ය හා කොන්ත්‍රාත් සපයමින් එය කඩා වැටීමෙන් වැලකීය.

"කොමියුනිස්ට්වරුන්ගේ" ජයග්‍රහනය පිලිබඳව තම උත්සුකයන් කිහිපය වේගයෙන් පහව ගිය බව රොං පසු කලෙක සිහිපත් කලේ ය. "කොමියුනිස්ට් පක්ෂය අනුමත කිරීම සඳහා මා එසවූයේ එක් අතක් පමනි. අත් දෙකම එසවූයේ නම් එය යටත් වීමක් වනු ඇත. එක් අතක් පමනක් එසවීම මා කල වරදකි. පක්ෂයට සහාය වීම වෙනුවෙන් මම දැන් අත් දෙකම ඔසවමි" යි ඔහු ප්‍රකාශ කලේ ය.

එසේ ක්‍රියාකලේ රොං පමනක් නොවේ. කලින් පැවති කේඑම්ටීයෙහි කොටස් නව ආන්ඩුවට එකතු වුනි. මාඕ 1949 වසරේ ඔක්තෝබරයේ තියනන්මෙන් චතුරස්‍රයෙහි දී චීන ජන රජය (පීආර්සී) ස්ථාපිත කිරීම ප්‍රකාශයට පත් කරන අවස්ථාවේ ඔහු සමග උරෙනුර ගැටී සිටියේ කේඑම්ටීයෙහි නිර්මාතෘ සුන් යට් සෙන්ගේ වැන්දඹුව වූ සොං ක්විංලිං ය. චියෑං කායිෂෙක්ගේ ආඥාදායකත්වයට විරුද්ධ වූ ඊනියා වාම කේඑම්ටීය ද ඇතුලුව පක්ෂ දොලහක් සීසීපීයෙහි අනුග්‍රහය පිලිගත්හ. මොවුහු චීන ජනතා දේශපාලන උපදේශක සභාව (සීපීපීසීසීය) වසයෙන් කටයුතු කලහ. පීආර්සීයෙහි ව්‍යවස්ථාව කෙටුම්පත් කරන ලද්දේ මෙම උපදේශක සභාව විසිනි.

ඉන් පසුව කරන ලද පෞද්ගලික ප්‍රාග්ධනය පවරා ගැනීම සමාජවාදී ප්‍රතිපත්ති කෙරේ නැඹුරුවක් සනිටුහන් කලේ නැත. ආර්ථිකයෙහි අංශ මුලුමනින් ම පවරා ගැනීමට තන්ත්‍රයට බල කෙරින. ග්‍රාමීය ඉඩම්හිමි පන්තියට අයිති ඉඩම් අල්ලාගැනීම හා නැවත බෙදා හැරීම තුලින් ගම්බද පෙදෙස්වල ප්‍රාග්ධනය හා නගරබද ප්‍රාග්ධනය අතර තිබූ බැම්ම කැඩී බිඳී ගියේ ය. බදු කුලිය හා අධික පොලිය මගින් ගොවි ජනතාව කොල්ල කෑම තුලින් කලින් මේ බැඳීම තහවුරු වුනි. කේඑම්ටීය බිඳවැටීමේ කාල පරිච්ඡේදය තුල සැලකිය යුතු ප්‍රමානයක ප්‍රාග්ධනයක් තායිවානයට හා හොංකොංවලට ගෙන යන ලදී. විදේශීය ආයෝජකයින්ද පැන ගොස් තිබුනි. එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ බාධක පැනවීම හා කොරියානු යුද්ධය ආරම්භවීම ලෝක ධනේශ්වර වෙලඳපොල සමග චීනයේ සම්බන්ධතාවය කඩාකප්පල් කලේය.

ඒ සමග ම, සෝවියට් සංගමය හා බීජිං අතර සන්ධානය හේතු කොට ගෙන ආර්ථික සංවිධානයේ නව අසමතීන් අවශ්‍ය වුනි. සෝවියට් තාක්ෂන වේදය හා කර්මාන්ත චීනයට මාරුවීම සම්බන්ධීකරනය කිරීම සඳහා රාජ්‍ය සැලසුම් ක්‍රියාත්මක කෙරින. මෙම වර්ධනයන්හි කූටප්‍රාප්තිය වූයේ 1956 වසරේ පොදුවේ කර්මාන්ත ජනසතු කිරීම යි. මෙය "සමාජවාදයට

පරිවර්තනය වීම " ලෙස හුවා දක්වුනි. මෙම වැඩ පිලිවෙලේ හරය වූයේ සමාජවාදය නොව, ජාතික වසයෙන් ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයකි. එය පදනම් වූයේ විශාල වසයෙන් කෘෂිකාර්මික රටක කර්මාන්ත, රජයේ පාලනයට නතු වීමත් කම්කරු පන්තිය දේශපාලන වසයෙන් යටපත් කිරීමත් මත ය.

1956 වසරේ දී, රොං සිය ව්‍යාපාර රජයට භාරදුනි. ඒ හේතුවෙන් ඔහු "රතු ධනවාදියා" ලෙස හුවා දක්වුනි. වන්දි වසයෙන් ඔහුට යුවාන් මිලියන 30ක් - එක්සත් ජනපද ඩොලර් මිලියන 12ක් - ගෙවන ලදී. එකල එය සැලකිය යුතු මුදලක් විය. 1966 වසරේ "සංස්කෘතික විප්ලවය" ඇරඹෙන අවස්ථාව තෙක් ඔහුට ලාභාංශ ලැබුනි. 1957 වසරේ දී ඔහු ෂැංහයි නගරයේ උප නගරාධිපති වසයෙන් පත් කෙරින. ඉන් දෙවසරකට පසුව, ඔහු රෙදිපිලි පිලිබඳව උප ඇමති වසයෙන් පත් කෙරින.

රොංගේ උසස්වීම සීසීපීය තුල ඊනියා "ධනවාදී මාවත අනුගමනය කරන්නන්ගේ" ප්‍රබලත්වය හා සම්පාත වුනි. ධනවාදී මාවත අනුගමනය කරන්නන් අතර වඩාත් කැපී පෙනෙන පෘතුලයින් වූයේ ලියූ ෂඕකී හා ඩෙං ෂියාඕපිං ය. ග්‍රාමීය ප්‍රදේශවල සමාජවාදය ගොඩනැගීමේ නිරර්ථක උත්සාහය මත පදනම්වූ මාඕගේ ආර්ථික ප්‍රතිපත්ති ව්‍යසනය පිට ව්‍යසනය ඇති කලේ ය. චීනයෙහි සමාජවාදය ගොඩනැගීමට භෞතික පදනමක් නොමැතිය යන්න ආර්ථික අර්බුදයෙන් පෙන්නුම් කරන ලදැයි තර්ක කිරීමට ලියූ හා ඩෙං ස්ටැලින්වාදි "අවධි දෙකේ" න්‍යාය උපයෝගි කර ගත්හ. රට දශක ගනනක හෝ ශතවර්ෂ ගනනක පවා ධනවාදී වර්ධනය පසුකර යුතු යයි ඔවුහු අවධාරනය කලහ.

සාරභූතව ගත්කල මාඕ හා ධනවාදී මාවත අනුගමනය කරන්නන් අතර කල්ලිවාදී අරගලයක් වූ 1960 ගනන්වල ඇතිවූ සංස්කෘතික විප්ලව කාල පරිච්ඡේදය තුල රොං තාවකාලිකව ප්‍රමුඛත්වයෙන් ඉවත් කෙරින. 1966 වසරේදී මාඕගේ රතු ආරක්ෂක භටයෝ රොංගේ මන්දිරයට කඩා වැදී ඔහුගේ භාර්යාවට පහර දුන්හ. එසේ වුවද, වැඩිදුර ප්‍රහාර වැලැක්වීම සඳහා අගමැති චූ එන් ලායි මැදිහත් විනි. "රොං චීන ජාතික ධනවාදීන්ගේ නියෝජිතයෙකි. ඔහු රට තුල හා රටින් පිටස්තරව බල සම්පන්න පුද්ගලයෙකි. ඔහු ආරක්ෂා කල යුතු ය"යි චූ ප්‍රකාශ කලේ ය.

## නිදහස් වෙලඳපොල වෙත හැරීම

ලියූ හා ඩෙං වැනි පුද්ගලයන් නෙරපා හැරිය ද රටේ ආර්ථික නිශ්චලනයට මාඕට පිලියම් නොතිබුනු අතර චීන ආර්ථිකය විවෘත කිරීමේ ඔවුන්ගේ වෙලඳ පොල ඉදිරි දර්ශනය වැඩි වසයෙන් යොදා ගත්තේ ය. 1971 වසරේ දී මාඕ එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සමග ගනුදෙනුවකට ඇතුලු විය. එමගින් චීනය තුල විදේශ ආයෝජන හා දියුනු ධනවාදී රටවල් සමග ආර්ථික සබඳතා විවෘත කිරීම පිලිබඳ ඉඩකඩ ඇති කෙරිනි.

1976 වසරේ මාඕගේ මරනයෙන් පසු ඩෙං සියාඕපිං තන්ත්‍රයෙහි ප්‍රධානියාගේ තත්වයට නැගීමෙන් පසු නිදහස් වෙලඳපොල න්‍යායපත්‍රයක් ඇරඹී ය. 1979 වසරේ දී චීනයට විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීම සිය කාර්යභාරය කොට ගත් ආන්ඩුවෙහි අංශයක් වූ චීන ජාත්‍යන්තර භාරය හා ආයෝජන සංස්ථාව (සීඅයිටීඅයිසී) පිහිටුවීම සඳහා ඩෙං විසින් රොං යිරෙන් තෝරා ගන්නා ලදි.

සීඅයිටීඅයිසී ආයතනයෙහි පලමු වැනි වසරේ මෙහෙයුම් තුල, රොං විදේශීය ව්‍යාපාරිකයින් 4000කට අධික සංඛ්‍යාවක් මුන ගැසිනි. තවද 1971 වසරේ දී බීජිං සමග රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇති කර ගත් හිටපු එක්සත් ජනපද රාජ්‍ය ලේකම් හෙන්රි කිසිංගර් මෙම සමාගමෙහි ප්‍රධාන ජාත්‍යන්තර උපදේශකවරයෙකු වසයෙන් රොං විසින් බඳවා ගැනිනි.

නිදහස් වෙලඳ කලාපවල යටිතල පහසුකම් ගොඩනැගීමෙන් හා සිය මෙහෙයුම් ඇරඹීමට විදේශ සමාගම්වලට සහායවීමෙන් රොං ආයෝජනයන්ට පහසුකම් සැලසීය. චීන ජාතික ජනතා කොංග්‍රසයෙහි හොංකොං නියෝජනය කල ෆිලිප් වොං ඔක්තෝබර් 28වැනි දින චයිනා ඩේලි පුවත්පතට මෙසේ පැවසී ය: "සීඅයිටීඅයිසී ආයතනය පිහිටුවීමෙහි ලා රොංගේ හැකියාව හා දෘෂ්ටිය නොවන්නට, චීනයේ ආර්ථික වර්ධනයේ පිම්ම මෙතරම් වෙගවත් නොවනු ඇත."

1992 වසර වන විට, සීඅයිටීඅයිසී ආයතනය නැව් ප්‍රවාහන සේවයෙහි, බලශක්ති උත්පාදනයෙහි හා ගොඩනැගිලි නිර්මානය කිරීමෙහි යෙදුනු අති විශාල ව්‍යාපාරික පද්ධතියක් බවට පත්විනි. අද දින වන විට, ලොව වටා ව්‍යවසායන් 200ක් සීඅයිටීඅයිසී ආයතනය සතු ය. එහි මුලු වත්කම් එක්සත් ජනපද ඩොලර් බිලියන 6.3කි. සීඅයිටීඅයිසී ආයතනය වර්ධනයවත්ම රොංගේ පෞද්ගලික ව්‍යාපාරයන් ද වර්ධනය විය. 1979 වසරේදී හොංකොංහි පිහිටි සිය ආයෝජනයන් කලමනාකරනය කිරීම සඳහා රොං සිය පුත්‍රයා වූ ලැරී රොං එහි යැවීය. ඩොලර් බිලියන 1.64ක සම්පත් සතු චීනයෙහි ධනවත්ම පුද්ගලයා වසයෙන් ෆෝබ්ස් සඟරාව 2005 වසරේ දී ලැරී රොං නම් කරන ලදි.

1989 වසරේ මැයි-ජූනි මාසවල ආන්ඩුවට එරෙහි විරෝධතා මර්දනය කිරීමෙන් අනතුරුව තව දුරටත් චීන ආර්ථිකය විවෘත කිරීමෙහි ලා රොං යිරෙන් ප්‍රධාන භූමිකාවක් ඉටු කලේ ය. තියනන්මෙන් චතුරස්‍රයෙහි කම්කරුවන් හා ශිෂ්‍යයන් සමූලඝාතනය කිරීම ඩෙං සියාඕපිං යුක්තිසහගත කලේ "සමාජවාදී ක්‍රමය" ආරක්ෂා කිරීමෙහිලා එය අත්‍යවශ්‍ය විය යන පදනම මතය. යථාර්ථය වූයේ එහි අරමුන තන්ත්‍රයේ නිදහස්

වෙලඳ ප්‍රතිපත්තිවල බලපෑමට එරෙහිව කම්කරු පන්තියේ විරෝධතා පොඩිපට්ටම් කිරීමයි.

"වෙලඳපොල ප්‍රතිසංස්කරනය" වේගවත් කිරීමෙහි ලා බීජිංහි අධිෂ්ඨානයෙහි සංකේතයක් ලෙස 1990 වසරේදී රොං චීනයේ උප ජනාධිපති තනතුරට උසස් කරන ලදි. *බ්‍රිතාන්‍යයේ ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පතෙහි පලවූ රොංගේ මරන නිවේදනයෙහි සඳහන් වූ පරිදිඃ " තනතුර ප්‍රධාන වසයෙන් චාරිත්‍රානුකූල එකක් වූ නමුදු එමගින් පැහැදිලි පනිවුඩයක් නිකුත් වුනිඃ චීනයෙහි කොමියුනිස්ට් දෙශපාලනයේ හා වෙලඳපොල ආර්ථිකයේ සංයෝගය නොවෙනස්ව පැවැත්වෙන්නක් විය. ඒ මග පෙන්නුම් කරන ලද්දේ "රතු ධනවාදියා විසිනි" එම අවුරුද්ද තුල, විදේශීය සෘජු ආයෝජන ගිවිසුම් මගින් චීනයට ඩොලර් බිලියන 111ක් ලැබුනි. මෙය 1979 වසරේ සිට 1989 වසර දක්වා මුලු දස වසරක කාල පරිච්ඡේදයක් තුල ලැබුනු ආයෝජන ප්‍රමානය මෙන් සිව් ගුනයකට ආසන්න ප්‍රමානයක් විය.

මේ දැවැන්ත ආයෝජන ගලා ඒමේ ප්‍රතිඵලය වූයේ චීන ධනපති පන්තියේ වේගවත් වර්ධනයයි. රොංගේ පවුල මෙන් පැරනි ධනේශ්වර පවුල් හා තායිවානයෙන් හා හොංකොංවලින් පැමිනි ධනේශ්වරයින්ට සමාන්තරව කොමියුනිස්ට් පක්ෂ ධුරාවලියෙන් සැලකිය යුතු ස්තරයක් ව්‍යාපාරිකයන් වසයෙන් ස්ථාපිත වුනි. "චීනයෙහි ධනපතියන්" යන හිසින් යුතු ක්‍රෙඩිට් ඇග්‍රිකොල් නමැති ප්‍රන්ස බැංකුව විසින් පල කරන ලද වාර්තාවකට අනුවඃ දැන් චීනයෙහි දල දේශීය නිෂ්පාදිතයෙන් 70 කට අධික ප්‍රතිශතයක් උත්පාදනය කෙරෙන්නේ පෞද්ගලික අයිතිය යටතේ ඇති සමාගම් මගිනි. රජයේ අයිතිය හෝ සාමූහික අයිතිය යටතේ හෝ විධිමත් ලෙස ලියාපදිංචි කරන ලද ව්‍යවසායන්ගෙන් විශාල වැඩි කොටස සත්‍ය වසයෙන් ක්‍රියාත්මක වන්නේ පෞද්ගලික අයිතිය යටතේ යයි එම වාර්තාවෙහි සටහන් වුනි.

අද දින මාඕගේ චීනය ලෝක ධනේශ්වර පර්යායෙහි ප්‍රධාන මුක්කුවකි. ලොව නිෂ්පාදනවලින් වැඩි කොටස රැඳී පවතින්නේ චීන කම්කරු පන්තිය අනුකම්පා විරහිත ලෙස සූරා කෑම මතය. මෙම වසරේ පලමුවැනි මාස 10 තුල චීනයෙහි විදේශීය වෙලඳාම ඩොලර් ට්‍රිලියන 1.148ක් දක්වා නැංවුනි. එක්සත් ජනපද භාන්ඩාගාර බැඳුම්කර වැඩි ම ප්‍රමානයක් මිලයට ගැනීමෙහි ලා ජපානයට පසුව දෙවැනි ස්ථානයෙහි පසුවන්නේ චීනය යි. එමගින් දැවැන්ත එක්සත් ජනපද හිඟයන් ආවරනය කිරීමට මුදල් සපයන්නේ චීනය යි. ඒ සමග ම ඛනිජ තෙල් හා අමුද්‍රව්‍ය වැඩිම ප්‍රමානයක් ආනයනය කරන චීනය, එමගින්, ඕස්ට්‍රේලියාව වැනි ධනේශ්වර ආර්ථිකයන් නංවා තැබීමට සහාය වෙයි.

චීනය කොමියුනිස්ට් රටක් නොවන බව අද බොහෝ දෙනාට පැහැදිලි ය. එනමුදු, ප්‍රධාන තනතුරු කිහිපයක් දරමින් "කොමියුනිස්ට්" චීනයෙහි අති විශාල ධනයක් රැස් කර ගත් ධනවාදියා වූ රොං යිරෙන්ගේ ජීවිතයෙන් පැහැදිලි වන්නේ චීනය සමාජවාදී රටක් බවට බීජිං තන්ත්‍රය විසින් මුල සිට ම කරන ලද ප්‍රකාශ ව්‍යාජ ඒවා වූ බවයි.

© www.wsws.org